## කුසලතා පරික්ෂණය (Skills Test) සඳහා ඇගයීම්කරුවන් බඳවා ගැනීම

**කුසලතා පරික්ෂණයේ ඇගයීම් (Skills Test Evaluation ) සිදු කිරීමට** ඇගයීම්කරුවෙකු ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය අනිවාර්යය වේ. ඒ සඳහා අයදුම් කිරීමට පහත සඳහන් සුදුසුකම් වලින් ඕනෑම එකක් සපුරා තිබීම අවශ්‍යවේ.

1. ඉල්ලුම් කරන වෘත්තීය / ක්ෂේත්‍රය ඇතුලත්ව හෝ ඊට අදාලව පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ උපාධියක් සමඟ අදාළ වෘත්තියට සම්බන්ධව කළමණාකරණ හෝ අධීක්ෂණ මට්ටමේ වසර තුන (03) ක පලපුරුද්දක් තිබීම.

2. ඉල්ලුම් කරන වෘත්තීයට / ක්ෂේත්‍රයට අදාළව පූර්ණකාලීන වර්ෂ 2 කට නොඅඩු කාලයකින් යුත් පිළිගත් ආයතනයකින් නිකුත් කරනු ලැබූ ඩිප්ලෝමාවක් සමඟ ඉල්ලුම් කරනු ලබන වෘත්තීයට / ක්ෂේත්‍රයට අදාළව කළමණාකරණ හෝ අධීක්ෂණ මට්ටමේ වසර පහ (05) ක පළපුරුද්දක් තිබීම.

3. ඉල්ලුම් කරනු ලබන වෘත්තියට / ක්ෂේත්‍රයට අදාලව තාක්ෂණ මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමක වසර 5ක් එම වෘත්තිය පුහුණුකිරීමේ කටයුතුවල නියැලීම.

4. රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පවත්වාගෙන යනු ලබන ශිල්පීය මට්ටමේ පාඨමාලාවක් සාර්ථක ලෙස හැදෑරීමෙන් පසු ආයතනයක අදාළ වෘත්තියෙහි අවම වශයෙන් වසර අට (08) ක කාලයක් සේවයේ නියැලී සිට දැනට අධීක්ෂණ හෝ කළමණාකරන මට්ටමේ තනතුරක සේවයෙහි නියැලී සිටීම.

**ඉහත සඳහන් සුදුසුකම් වලට අමතරව අයදුම්කරු පහත සඳහන් නිර්ණායකද සපුරා තිබිය යුතුය.**

5. අයදුම්කරු වැඩකරන වයසේ පසුවේ නම් ඔහු / ඇය ඇගයීම්කරුවෙකු ලෙස කටයුතු කිරීමට අපේක්ෂා කරන වෘත්තියෙහි හෝ ඊට ඉහළ මට්ටමේ තනතුරක් දැරීම. අයදුම්කරු විශ්‍රාමගොස් හෝ රැකියාවකින් ඉවත්වී ඇත්නම් එසේ ඉවත්වීමට පෙර අදාළ වෘත්තියෙහි හෝ ඊට ඉහළ මට්ටමේ තනතුරක් දරා තිබීම.

6. අයදුම්කරු තම සේවා ආයතනයේ විනය විරෝධී ක්‍රියාකාරකම්වල නියැලී වැරදිකරුවෙකුවී නොතිබීම හා අධිකරණය හමුවේ වරදකරුවෙකුවී නොතිබීම.

**උපදෙස්**
**කුසලතා පරික්ෂණයේ ඇගයීම් (Skills Test Evaluation ) සිදු කිරීමට** ඇගයීම්කරුවෙකු ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට ඉල්ලුම් පත් www.cida.gov.lk වෙබ් අඩවියෙන් හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය / අනුබද්දිත ආයතන වලින් ලබා ගත හැක.

ගෙවීම් මුදල් ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ''සභාපති , ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය'' නමින් ඇති 77454975 අංක දරණ බැංකු ගිණුමට බැර කර මුදල් තැන්පත් කිරීමේ පිටපත මෙම අයදුම් පතට අමුණා එවිය යුතුය.
අයදුම්පත් බහා එවනු ලබන වම්පස ඉහළ කෙළවරේ "APPLICATION FOR EVALUATORS" ලෙස සඳහන් කල යුතුය.
සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ ජනරාල් , ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, "සව්සිරිපාය", නො. 123, විජේරාම මාවත, කොළඹ 07. ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඉහත සුදුසුකම් ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරික්ෂාකර බලා, අවශ්‍යතාවය අනුව තෝරාගෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ඇගයීම්කරුවන් ලෙස බඳවා ගැනීමෙන් අනතුරුව සියලුම ඇගයීම්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහනට සහභාගී විය යුතුය. මෙලෙස තෝරාගනු ලබන ඇගයීම්කරුවන්ගේ නාම ලේඛණයක් සිඩා වෙබ් අඩවියේ පවත්වාගෙන යනු ලැබේ.